# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2144/22 – 2019 ඔක්තෝබර් 09 වැනි බදාදා – 2019.10.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 මාර්තු මස 20 දින අංක 1802/14 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2013 අංක 82 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/10/2012/LRB/21.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය: WGSWD&EIP/ACQ/KB/08.
2019 සැප්තැම්බර් මස 26 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 535 බී, දිවුල්පිටිය බටහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දිවුල්පිටිය පැපිලියාන බෙල්ලන්තොට ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කො 9470 හා 2019.01.25 දිනැති සංශෝධිත මූලික පිඹුරේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අංක 06 – මීගහවත්ත ඔවිට – ප්‍රමාණය: හෙක්. 0.0611

උතුරට: කැබලි අංක 3, 4, 5 සහ ශ්‍රී මහා බෝධිරාජාරාම පාරේ වරි. අංක 16/14/ඒ දරන ඉඩම; නැගෙනහිරට: කැබලි අංක 4, 5 සහ ශ්‍රී මහා බෝධිරාජාරාම පාරේ වරි. අංක 16/14/ඒ දරන ඉඩම, වරි. අංක සොයාගත නොහැකි ඉඩම සහ කැබලි අංක 7; දකුණට: කැබලි අංක 7; බටහිරට: කැබලි අංක 3.

10 - 853